සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved



8 ශ්‍රේණිය | තෙවන වාර පරීක්ෂණය - 2024 | 33 S I

නම: ..........................................

# ඉතිහාසය

කාලය පැය දෙකයි

## I කොටස

- **ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.**
- **අංක 01 සිට 05 දක්වා ප්‍රශ්නවලට අදාළ පිළිතුර දී ඇති පිළිතුරු අතරින් තෝරන්න.**

01) මහානික්කවට්ටි වැව හෙවත් නූතන මානන්කට්ටිය වැව ඉදිකරවන ලද්දේ,
   1. වසභ රජු ය. 2. මහසෙන් රජු ය. 3. පණ්ඩුකාභය රජු ය. 4. ධාතුසේන රජු ය.

02) පහත දාගැබ් අතරින් වළගම්බා රජු විසින් ඉදිකරවන ලද දාගැබ කුමක් ද?
   1. රුවන්වැලිසෑය 2. ථූපාරාමය 3. ජේතවනාරාමය 4. අභයගිරිය

03) සෙංකඩගල නගරය මුල් කර ගනිමින් වෙන ම රාජධානියක් පිහිට වූ පාලකයා කවුරුන් ද?
   1. ජයවීර බණ්ඩාර රජතුමා 2. කරලියද්දේ බණ්ඩාර රජතුමා
   3. සේනාසම්මත වික්‍රමබාහු රජතුමා 4. යමසිංහ බණ්ඩාර රජතුමා

04) ක්‍රි.ව. 1453 වර්ෂයේ දී, ඉස්ලාම් භක්තිකයන් වූ තුර්කි ජාතිකයන් විසින් අල්ලාගනු ලැබූ වෙළෙඳ නගරය වන්නේ,
   1. වතිකානුව යි. 2. කොන්ස්තන්තිනෝපලය යි.
   3. වැනීසිය යි. 4. ඇලෙක්සැන්ඩ්‍රියාව යි.

05) අප්‍රිකාවේ දකුණු කෙළවර පිහිටි තුඩුව දක්වා පැමිණ එය කුණාටු තුඩුව ලෙස නම් කරන ලද නාවිකයා කවුරුන් ද?
   1. ක්‍රිස්ටෝෆර් කොලොම්බස් 2. ෆර්ඩිනන්ඩ් මැගලන්
   3. බර්තොලමියුඩයස් 4. වස්කෝ ද ගාමා

- **ප්‍රශ්න අංක 06 - 10 දී ඇති ප්‍රකාශ නිවැරදි නම් වරහන් තුළ ( ✔ ) ලකුණ ද වැරදි නම් (x) ලකුණ ද යොදන්න.**

06) මහා පැරකුම් රජතුමාගේ රජමාලිගය වූයේ පොළොන්නරු ඇතුළු නුවර පිහිටි වෛජයන්ත ප්‍රාසාදය යි. ( )

07) කීර්ති ශ්‍රී රාජසිංහ රජුගෙන් පසු ඔහුගේ සහෝදරයා රාජාධි රාජසිංහ නමින් උඩරට රජ විය. ( )

08) ජොහැන්නස් කෙප්ලර් තාරකා විද්‍යාවේ පියා ලෙස හඳුන්වනු ලැබේ. ( )

09) ලන්දේසීන්ගේ පෙරදිග මූලස්ථානය වූයේ මදුරාසිය යි. ( )

10) .ධර්මපාල රජු තෑගි ඔප්පුවක් මගින් කෝට්ටේ රාජ්‍ය පෘතුගීසීන්ට පවරා දෙන ලදී. ( )

- **අංක 11 සිට 15 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර වරහන් තුළින් තෝරා තිත් ඉරි මත ලියන්න.**

11) අනුරාධපුරයේ රජ කළ කුටකණ්ණතිස්ස රජු ................................................ නමින් උයනක් තනවා ඇත.

12) කරලියද්දේ රජුගේ දියණිය වූ කුසුමාසන දේවිය, ................................................ නමින් පෘතුගීසීන් වෙතින් බෞතීස්ම ලැබූහ.

13) රෝම ශිෂ්ටාචාරය බිඳ වැටීමත් සමඟ එළඹුණු වසර දහසක පමණ කාලය යුරෝපයේ ................................ ලෙස සැලකේ.

14) පෘතුගීසීන්ගේ මව් රට වන පෘතුගාලය ........................................ අර්ධද්වීපය තුළ පිහිටි රටකි.



Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

15) ෆ්‍රැන්සිස්කෝ ද අල්මේදා පෙරදිග පෘතුගීසි ප්‍රතිරාජයා වශයෙන් පත් කොට එවීමේ දී ................................ දූපත සොයාගත යුතු යැයි අල්මේදාට පෘතුගාල රජු උපදෙස් ලබා දී ඇත.
(දෝන මාගරීදා, පද්මස්වර, සෙයිලන්, මහමෙවුනා, පුනරුද, පිලිපීන, මධ්‍යතන, කොරියානු, අයිබීරියන්, දෝන කතිරිනා)

- **අංක 16 සිට 20 දක්වා I තීරුවේ සඳහන් තොරතුරු හා සම්බන්ධ පිළිතුර II තීරුවෙන් ගැළපූ විට ලැබෙන නිවැරදි පිළිතුර තෝරන්න.**

16)

| I තීරුව | II තීරුව |
|---|---|
| 1. සොරොව්ව | A. වෙනත් ජල මූලාශ්‍රයකින් වැවට ජලය ලබා ගැනීම |
| 2. බිසෝකොටුව | B. දිය රැලි නිසා වැව් බැම්ම සේදී යාම වැළැක්වීම |
| 3. රළපනාව | C. වැවේ ජලය මනා පාලනයකින් යුතුව පිටතට ගැනීම |
| 4. ඇතුළුවාන | D. වැවේ ජලය පිටතට ලබා ගැනීම |

1. ABCD    2. CBDA    3. CADB    4. DCBA

17)

| I තීරුව | II තීරුව |
|---|---|
| 1. ජෝතිය නම් සිටුවරයා | A. කෝට්ටේ රාජ්‍යයේ විජයබා කොල්ලය සිදුවීම |
| 2. කරලියද්දේ බණ්ඩාර | B. සීතාවක රාජසිංහ රජුගේ උඩරට ආක්‍රමණය |
| 3. යමසිංහ බණ්ඩාර | C. කෝට්ටේ රජුට විරුද්ධව උඩරට කැරැල්ලක් ඇති කිරීම |
| 4. ජයවීර රජු | D. පෘතුගීසීන් උඩරට රජු ලෙස නම් කිරීම |

1. ABCD    2. CBDA    3. CADB    4. DCBA

18)

| I තීරුව | II තීරුව |
|---|---|
| 1. ලියනාඩෝ ඩාවින්චි | A. අන්තිම රාත්‍රී භෝජනය සිතුවම |
| 2. මයිකල් ආන්ජිලෝ | B. රුධිර සංසරණ පද්ධතිය |
| 3. විලියම් හාවේ | C. අවසාන විනිශ්චය සිතුවම |
| 4. පැරසල්සස් | D. ලෙඩ රෝග සෑදීමට තුඩු දෙන හේතු |

1. ACBD    2. ACDA    3. CDAB    4. DBCA

19)

| I තීරුව | II තීරුව |
|---|---|
| 1. ටොලමි | A. බටහිර ඉන්දියා දූපත් |
| 2. නාවික හෙන්රි | B. පීරු දේශය |
| 3. ක්‍රිස්ටෝපර් කොලොම්බස් | C. ලෝක සිතියම |
| 4. ෆ්‍රැන්සිස්කෝ පිසාරෝ | D. නාවික අභ්‍යාස විද්‍යාලය |

1. ACBD    2. BCDA    3. CDAB    4. DBCA

20)

| I තීරුව | II තීරුව |
|---|---|
| 1. මාතර | A. ඔගස්ටීනියන්වරුන් |
| 2. සතර කෝරළය | B. ප්‍රැන්සිස්කන්වරුන් |
| 3. සත් කෝරළය | C. ඩොමිනිකන්වරුන් |
| 4. සබරගමුව | D. ජේසුයිට්වරුන් |

1. ACDB    2. BADC    3. CDAB    4. DBAC

මුළු ලකුණු (2 x 20 = 40)



Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

## II කොටස

**• පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ. පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 05 කට පිළිතුරු සපයන්න.**
**• පිළිතුරු ලිවීම සඳහා වෙන ම කඩදාසි භාවිතා කරන්න.**

01) (A) i. මෙම පින්තූරයෙන් දැක්වෙන රජතුමා හඳුනාගෙන නම් කරන්න.
ii. ඔහුගේ පාලන මධ්‍යස්ථානය කුමක් ද?
iii. එතුමා රජවීමට පෙර හැඳින් වූ නම කුමක් ද?
iv. ඉංග්‍රීසින් විසින් මෙතුමා පිටුවහල් කරන ලද ප්‍රදේශය කුමක් ද?
(ලකුණු 04)




(B) i. මෙම පින්තූරයෙන් දැක්වෙන පුද්ගලයා හඳුනාගෙන නම් කරන්න.
ii. එතුමා කුමන ජාතිකයෙක්ද?
iii. මොහු විසින් උඩරටට දියත් කරන ලද ආක්‍රමණය හඳුන්වන නම කුමක්ද?
iv. කෝට්ටේ ප්‍රධානීන් සමග මෙතුමා අත්සන් කරන ලද ගිවිසුම හඳුන්වන නම කුමක්ද?
(ලකුණු 04)



(C) i. මෙම පින්තූරයෙන් දැක්වෙන ගොඩනැගිල්ල කුමක් ද?
ii. එය ඉදිකරවන ලද පාලකයා කවුරුන් ද?
iii. ඔහුගේ රාජධානිය කුමක් ද?
iv. එම රාජධානියේ ආරම්භක පාලකයා කවුරුන් ද?
(ලකුණු 04)



(D) මෙහි දැක්වෙන ලෝක සිතියම් කොටස ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
i. මෙම සිතියමේ A අක්ෂරයෙන් දැක්වෙන්නේ ශ්‍රී ලංකාව යටත් විජිතයක් බවට පත් කරගත් ඉංග්‍රීසින්ගේ මව් රටයි. එය හඳුනාගෙන නම් කරන්න.
ii. සිතියමේ D අක්ෂරයෙන් දැක්වෙන්නේ ගොඩබිම් සේද මාවතේ ආරම්භක රටයි එම රට කුමක් ද?
iii. පෘතුගීසීන්ගේ මව් රට වන පෘතුගාලය දැක්වෙන ඉංග්‍රීසි අක්ෂරය කුමක් ද?
iv. රතු මුහුද දැක්වෙන ඉංග්‍රීසි අක්ෂරය කුමක් ද?
(ලකුණු 04)






Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

02) i. පහත ඇළ මාර්ග ඉදිකරවන ලද පාලකයන් නම් කරන්න.

A. ඇළහැර ඇළ

B. යෝධ ඇළ

C. මිනිපේ ඇළ (ල.03)

ii. ඇළ මාර්ග ඉදිකිරීමේ අරමුණු (අවශ්‍යතා) දෙකක් නම් කරන්න. (ල.04)

iii. පහත ඡායාරූප හඳුනාගෙන නම් කරන්න.

A........................ B........................ C........................ D........................ (ල.04)

03) i. පළමුවන විමලධර්මසූරිය රජතුමාට පසුව උඩරට බලයට පත් වූ පාලකයන් තිදෙනා පිළිවෙළින් නම් කරන්න.

A. ..................................

B. ..................................

C. .................................. (ල.03)

ii. A. මහනුවර සමාජයේ පැවති විවාහ ක්‍රම දෙකක් නම් කරන්න.

B. මහනුවර යුගයේ සිතුවම් දැකිය හැකි ස්ථාන දෙකක් නම් කරන්න. (ල.04)

iii. පහත ඡායාරූපය ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.



A. මෙම සිතුවමෙන් දැක්වෙන රජතුමා කවුරුන් ද?

B. මෙම සිතුවමෙන් දැක්වෙන ස්වාමීන් වහන්සේ කවුරුන් ද?

C. මෙම සිතුවමෙන් දැක්වෙන කාර්යය කුමක් ද?

D. මෙම රජතුමා විසින් ප්‍රතිසංස්කරණ කරන ලද විහාරයක් නම් කරන්න.

(ල.04)

04) i. මධ්‍යතන යුගය අවසානයේ යුරෝපයේ බිහි වූ විශ්වවිද්‍යාල තුනක් නම් කරන්න. (ල.03)

ii. පුනරුද සමයේ ගෘහ නිර්මාණ ශිල්පයේ දැකිය හැකි ලක්ෂණ දෙකක් නම් කරන්න. (ල.04)

iii. පුනරුදය සමයේ පහත කාර්යය හෝ සොයා ගැනීම් සිදුකරන ලද පුද්ගලයන් නම් කරන්න.

A. පියේටා ප්‍රතිමාව නිර්මාණය ......................................

B. පුනරුද සමයේ කලාවට අනුග්‍රහ දැක් වූ ෆ්ලෝරන්ස් නගරයේ සිටි ධනවත් පවුල ........................

C. සෞරග්‍රහ මණ්ඩලයේ ග්‍රහලෝක සියල්ල ඉලිප්සාකාරව සූර්යා වටා ගමන් කරන බව ප්‍රකාශ කිරීම ...............................

D. විටෙන්බර්ග් විශ්වවිද්‍යාලයේ මහාචාර්ය පදවියක් දරමින් ක්‍රිස්තියානි පල්ලියට විරුද්ධව අදහස් දැක් වූ පුද්ගලයා .................................. (ල.04)

05) i. මධ්‍යධරණී මුහුදු ආශ්‍රිත පිහිටි වෙළෙඳ නගර තුන නම් කරන්න. (ල.03)

ii. යුරෝපීයන් ආසියාවට පැමිණීමේ අරමුණු දෙකක් නම් කරන්න. (ල.04)

iii. A. යුරෝපයේ පැවති වැඩවසම් ක්‍රමයේ දක්නට ඇති ලක්ෂණ දෙකක් නම් කරන්න.

B. ප්‍රංශ ජාතිකයන් ඉන්දියාවේ වෙළෙඳ ගබඩා පිහිටවා ගත් ප්‍රදේශ දෙකක් නම් කරන්න. (ල.04)



Sri Lanka's Largest Past Paper Bank – iskolee.com


06) i. විජයබා කොල්ලය නිසා කෝට්ටේ රාජ්‍ය බෙදී ගිය කොටස් තුන නම් කරන්න. (ල.03)

ii. සීතාවක රාජධානියේ උන්නතියට තුඩු දුන් හේතු දෙකක් නම් කරන්න. (ල.04)

iii. සිංහලයන් හා පෘතුගීසින් අතර ඇති වූ සටන් ඇසුරෙන් ඇසුරින් පහත වගුවේ හිස්තැන් පුරවන්න. (ල.04)

| පෘතුගීසින් පරාජයට පත් කල සටන සිදු වූ ස්ථානය | උඩරට රජු | පෘතුගීසි හමුදාව මෙහෙයවූ තැනැත්තා |
|---|---|---|
| A. ........................ | I වන විමලධර්මසූරිය රජතුමා | පේරෝ ලෝපෙස් ද සූසා |
| රන්දෙනිවෙල | සෙනරත් රජතුමා | B. ........................ |
| ගන්නෝරුව | C. ........................ | D. ........................ |

07) ඡායාරූප සටහන ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. (ල.11)




1. ඉංග්‍රීසි C අක්ෂරයෙන් දැක්වෙන පැරණි නගරය කුමක් ද? ........................
2. එම නගරය මුල්කරගෙන නව රාජ වංසයක් ගොඩනගන ලද ඉංග්‍රීසි B අක්ෂරයෙන් දැක්වෙන පාලකයා කවුරුන් ද? ..........................................
3. එම පාලකයාගේ බෞතීස්ම නාමය කුමක් ද? ..........................................
4. එම පාලකයාගේ පියා කවුරුන් ද? ..........................................
5. 1815 වසරේ දී C ඉංග්‍රීසි අක්ෂරයෙන් දැක්වෙන නගරය අල්ලාගත් ඉංග්‍රීසි ආණ්ඩුකාරවරයා කවුරුන් ද? ..........................................
6. ඉංග්‍රීසින් හා සිංහලයන් අතර එම නගරයේ දී අත්සන් කරන ලද ගිවිසුම හඳුන්වන නම කුමක් ද? ..........................................
7. ඉංග්‍රීසි A අක්ෂරයෙන් දැක්වෙන කැටයමේ දැක්වෙන කෝට්ටේ රාජ්‍යයේ සිටි රජ කුමරු කවු ද? ..........................................
8. එම කුමරුගේ මව කවුරුන් ද? ..........................................
9. එම කුමරුගේ පියා කවුරුන් ද? ..........................................

10. කැටයමේ දැක්වෙන කුමරු අභිෂේක කිරීම සිදුකරනු ලැබුවේ කුමන රටක පාලකයෙකු විසින් ද? ..........................................

11. ඉංග්‍රීසි C අක්ෂරයෙන් දැක්වෙන පැරණි නගරයට ආරක්ෂාව සපයන දුර්ග මාර්ගයක් නම් කරන්න. ..........................................

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

**ඉතිහාසය - 8 ශ්‍රේණිය**
**පිළිතුරු පත්‍රය**

1) 1  2) 4  3) 3  4) 2  5) 3  6) ✔  7) ✔  8) x  9) x  10) ✔  11) පද්මස්වර  12) දෝනකතිරිනා
13) මධ්‍යතන යුගය  14) අයිබීරියන්  15) සෙයිලන්  16) 4  17) 2  18) 1  19) 3  20) 2

**II පත්‍රය**

01) (A) i. ශ්‍රී වික්‍රම රාජසිංහ රජතුමා  ii. මහනුවර  iii. කන්නසාමි  iv. වෙල්ලෝරයට
(B) i. දොන් ජෙරනිමෝ ද අසවේදු ii. පෘතුගීසි  iii. බලන  iv. මල්වාන
(C) i. බැරැණ්ඩි කෝවිල  ii. පළමු රාජසිංහ / සීතාවක රාජසිංහ  iii. සීතාවක  iv. මායාදුන්නේ
(D) i. බ්‍රිතාන්‍ය  ii. චීනය  iii. B  iv. C

02) i. (A) වසභ රජු  (B) ධාතුසේන රජතුමා  (C) පළමු අග්ගබෝධි රජතුමා
ii. • වැව්වල හෝ අමුණුවල සිට වගා බිම් කරා ජලය ගෙන යාම • අමුණක සිට වැවකට හෝ වැව් පද්ධතියකට ජලය ගෙන යාම • වැවක සිට වැවකට හෝ වැව් කිහිපයකට ජලය ගෙන යාම
iii. A ශිව දේවාලය, B නිලක්කගම බෝධිඝරය, C මිහින්තලේ කණ්ටක චෛත්‍ය/ වාහල්කඩ, D නෙළුම් පොකුණ

03) i. (A) සෙනරත් රජතුමා (B) දෙවන රාජසිංහ රජතුමා (C) දෙවන විමලධර්මසූරිය රජතුමා
ii. (A) දීග විවාහය / බින්න විවාහය (B) දඹුල්ල, දෙගල්දොරුව, දළදා මාලිගාව, මුල්ගිරිගල
iii. (A) කීර්ති ශ්‍රී රාජසිංහ රජු (B) වැලිවිට සරණංකර හිමි (C) කීර්ති ශ්‍රී රාජසිංහ රජු විසින් වැලිවිට සරණංකර හිමියන්ට සංඝරාජ පදවිය පිරිනැමීම (D) දඹුලු විහාරය

04) i. බොලොඤ්ඤා, පාදුවා, පැරිස්, ඔක්ස්ෆර්ඩ්, කේම්බ්‍රිජ්
ii. වටකුරු ආරුක්කු, උස් කුලුනු, අර්ධ ගෝලාකාර ශිඛර
iii. (A) පියේටා (B) මෙඩිචි (C) ජොහැන්නස් කෙප්ලර් (D) මාටින් ලූතර්

05) i. ජිනෝවා, ඇලෙක්සැන්ඩ්‍රියා, වැනීසිය
ii. • ආසියාවේ නිෂ්පාදනය කෙරුණු කුළු බඩු ඇතුළු සෙසු වෙළෙඳ ද්‍රව්‍ය ලබා ගෙන යුරෝපයට ගෙන ගොස් අලෙවි කොට ආර්ථික වශයෙන් ලාභ ලබා ගැනීම. • මුස්ලිම් ජාතිකයන් සතු වූ ආසියාවේ වෙළෙඳ ඒකාධිකාරය යුරෝපීයන් අතට ලබා ගැනීම. • ආසියාතික රටවල තම ආගම පැතිරවීම. • (A) රදලයන් පාලන කටයුතු සඳහා සහාය වීම, ඉඩම් හිමිකම රදලයන් සතු වීම, ඉඩම්වල වගා කිරීම සාමාන්‍ය ගොවි ජනතාවටත් පැවරී තිබීම. (B) පොන්ඩිචේරි, කරිකාල්, චන්ද්‍රනගර්

06) i. කෝට්ටේ, රයිගම, සීතාවක
ii. • මායාදුන්නේ හා පළමුවන රාජසිංහ යන රජවරුන් රණශූරයන් වීම. • දළදාව සීතාවකට වැඩම කරවීම • සීතාවක රජවරුන් අනුගමනය කළ පෘතුගීසි විරෝධි ප්‍රතිපත්තිය • රයිගම රාජධානිය හා උඩරට රාජධානිය සීතාවකට ඈඳා ගැනීම. • කෝට්ටේ රාජධානිය පරිහානියට යාම.
iii. (A) දන්තුරේ (B) කොන්ස්තන්තිනු ද සා (C) II රාජසිංහ රජු (D) දියෝගෝ ද මෙලෝ

07)

| ප්‍ර.අ. | පිළිතුර | ප්‍ර.අ. | පිළිතුර |
|---|---|---|---|
| 1 | මහනුවර | 7 | ධර්මපාල |
| 2 | පළමු විමලධර්මසූරිය | 8 | සමුද්‍ර දේවිය |
| 3 | ඔස්ට්‍රියාවේ දොන් ජුවන් | 9 | වීදිය බංඩාර |
| 4 | වීරසුන්දර බණ්ඩාර | 10 | පෘතුගීසි |
| 5 | රොබට් බ්‍රවුන්රිග් | 11 | බලන/හුන්නස්ගිරි/ගලගෙදර |
| 6 | උඩරට ගිවිසුම | 12 | |



Sri Lanka's Largest Past Paper Bank – iskolee.com